බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ බුද්ධි ඒකකය වෙත, කඩිනම් සේවා අවශ්‍යතාව මත බන්ධනාගාර නියාමක තනතුරු 200 ක් සම්පූර්ණ කිරීම සඳහා ත්‍රිවිධ හමුදාවෙන් නීත්‍යානුකූලව වසර 12 න් ඉවත්වූ නිලධාරීන් බඳවා ගැනීම.

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ත්‍රිවිධ හමුදාවෙන් නීත්‍යානුකූලව වසර 12 න් ඉවත් වූ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. බඳවා ගන්නා ශ්‍රේණිය - බන්ධනාගාර නියාමක (පිරිමි)

2. සුදුසුකම්

2.1 පළපුරුද්ද - අවම වශයෙන්, වසර 12ක ත්‍රිවිධ හමුද සේවයේ යෙදී සිට නීත්‍යානුකූලව ඉවත් වූ නිලධාරියෙකු විය යුතුය. (සහතික මඟින් සනාථ කළ යුතුය.)

2.3. කායික සුදුසුකම් -
- i. අවම උස අඩි 05 අඟල් 04
- ii. පපුව හුස්ම තාල්ලා අඟල් 32 ක් විය යුතුය.

2.4. වෙනත් සුදුසුකම් -
- i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
- ii. මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
- iii. යහපත් චරිතයකින් යුක්ත අයවලුන් විය යුතුය. එය පොලිස් නිශ්කාෂණ වාර්තාවක් මඟින් සනාථ කර ගැනීමට කටයුතු කෙරේ.
- iv. චරිත දූෂණයට අදාළ වරදක් සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීම ඉහත තනතුරට පත්වීම සඳහා සම්පූර්ණ නුසුදුසුකමක් වන්නේය.
- v. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කළ යුතුය.
- vi. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් පත් කරනු ලබන ශාරීරික යෝග්‍යතා ඇගයීම් මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ශාරීරික යෝග්‍යතා හෙවත් ඔරොත්තු දීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

2.5.වයස - වයස අවුරුදු 40 නොඉක්මවූ යුධ, ගුවන්, නාවික ත්‍රිවිද හමුද සේවයෙන් නීත්‍යානුකූලව ඉවත් වූ අයවලුන් විය යුතුය.

3. **තනතුරේ ස්වභාවය** - ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය.

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව ඉදිරියේදී රජය ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.)

4. **වැටුප් ක්‍රමය** - වැටුප් කේත අංකය : RS-1-2016

- වැටුප් පරිමාණය : 29540/ - 7 ×300 - 27 ×370 - 41630/-

ආරම්භක වැටුප් පියවරෙහි තබා වැටුප් ගෙවනු ලැබේ.

5. **බඳවා ගැනීමේ ක්‍රමය**

5.1. ශාරීරික යෝග්‍යතාව පිළිබඳ පරීක්ෂණයකින් සමත්වන අයවලුන් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර එහිදී කුසලතා අනුපිළිවල අනුව ඉහලම ලකුණු ලබන අයදුම්කරුවන් මෙම තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

5.2. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ	උපරිම ලකුණු ප්‍රමාණය	තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය
අතිරේක අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්	25	අදාළ නොවේ.
වෘත්තීය සුදුසුකම්	15	
ක්‍රීඩා කෞෂල්‍යය	25	
නායකත්වය හා ප්‍රජා සේවාවන්	25	
සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව	10	
එකතුව	100	

(ත්‍රිවිධ හමුදාවේ සේවය කළ කාලය තුළදී සහ ඊට පෙර දක්වන ලද දක්ෂතාවයන් සලකා ලකුණු ලබා දෙන අතර, අදාළ සුදුසුකම් සහතික මඟින් සනාථ කළ යුතුය.)

5.2.1. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සහ ශාරීරික යෝග්‍යතාවය පිළිබඳ පරීක්ෂණ මණ්ඩලය බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් පත් කරනු ලබන අතර, සවිස්තර ලකුණු ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කරනු ලැබේ.

6. **කාර්යක්ෂමතා කඩඉම් විභාගය** - නියාමක තනතුරට පත්වී වසර 03 ක් සම්පූර්ණ වීමට පෙර සමත් විය යුතුය.

7. **භාෂා ප්‍රවීණතාව** -

භාෂාව	ලබාගත යුතු ප්‍රවීණතාව
රාජ්‍ය භාෂාව	රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය.
අනෙක් රාජ්‍ය භාෂාව	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව වසර 03ක් ඇතුළත ලබා ගත යුතුය.

වෙනත් කොන්දේසි

- i. වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.
- ii. උසස් වීම් අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ විධි විධාන අනුව සිදු කරනු ලැබේ.
- iii. බඳවා ගැනීම් සම්බන්ධව සම්පූර්ණ තීරණ ගැනීම පත්වීම් බලධාරියා සතු වේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

8.1 ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආකෘතියට අනුකූල විය යුතුය. එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8.27 " x 11.69" (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින් සිය අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද හෝ යතුරු ලියනය කරන ලද හෝ අයදුම්පත් ද භාවිත කළ හැකිය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අවසන් වරට සේවය කරන ලද රෙජිමේන්තු ප්‍රධානියා හෝ කඳවුරු භාර අධිකාරී ලත් නිලධාරිගේ සහතිකය සමග 2021.02.05 දිනට පෙර ලියා පදිංචි තැපෑලෙන්, **බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, බන්ධනාගාර මූලස්ථානය, අංක : 150, බේස්ලයින් පාර, කොළඹ 09.** ලිපිනයට යොමු කළ යුතු ය.අදාළ ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවර **"බන්ධනාගාර බුද්ධි අංශයේ නියාමක තනතුරට බඳවා ගැනීම"** ලෙස සටහන් කළ යුතු ය.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
අංක 150, බේස්ලයින් පාර,
කොළඹ 09.

2021.01.15

(කාර්යයාලීය ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ, බුද්ධි හා ආරක්ෂක ඒකකයේ බන්ධනාගාර නියාමක (පිරිමි) තනතුරට ත්‍රිවිධ හමුදාවේ නීත්‍යානුකූලව වසර 12ක සේවයෙන් පසු ඉවත් වූ නිලධාරීන් බඳවා ගැනීම

01. (අ) මුලකුරු අගට යොද මුලකුරු සමඟ නම : .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : (GUNAWARDHANA , M. G. B. S. K.)
(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : .....
(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : .....

02. (අ) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : .....
(ආ) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට එවනු ලැබේ) : .....

03. ස්ත්‍රී/පුරුෂ භාවය : [ ]
ස්ත්‍රී - 1, පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

05. දුරකථන අංකය : ජංගම [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]
ස්ථාවර [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

06. විවාහක / අවිවාහක බව : .....

07. උපන් දිනය :
වර්ෂය: [ ][ ][ ][ ] මාසය: [ ][ ] දිනය: [ ][ ]

08. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස (2021.02.05) :
අවුරුදු : [ ][ ][ ][ ] මාස: [ ][ ] දින: [ ][ ]

09. පුරවැසිභාවය (පරම්පරාවෙන් ද / ලියාපදිංචි කිරීමෙන්ද යන වග) :- .....

10. ශාරීරික මිනුම් :
උස : අඩි : ..... අඟල් : .....
පපුව : අඟල් : .....

11. යුධ/ගුවන්/නාවික හමුද සේවය පිළිබඳ විස්තරය. (සේවය සනාථ කිරීම සඳහා ඔබ අවසන් වරට සේවය කළ ස්ථානය මගින් ලබා ගත් ලිපියක සහතික කරන ලද ඡායා පිටපතක් අයදුම්පත සමග අමුණා තිබීම අනිවාර්ය අතර, මුල් පිටපත් ඔබ සතුව තබා ගත යුතු ය.)
(අ) අදාළ සේවය : (යුධ/ගුවන්/නාවික) : .....
(ආ) අදාළ තනතුර/තනතුරු : .....
(ඇ) එම තනතුරට බැඳුණු දිනය : .....
(ඈ) සේවයෙන් ඉවත් වූ දිනය : .....
(ඉ) සේවයෙන් ඉවත් වීමට හේතුව : .....
(ඊ) ත්‍රිවිධ හමුද සේවා කාලය : .....

12. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස.(සා.පෙළ)
(i) විභාගයේ වර්ෂය :- .....
(ii) විභාග අංකය :- .....
(iii) විභාග ප්‍රතිඵල :- .....

විෂයය	ශ්‍රේණිය

අ.පො.ස.(උ.පෙළ)
(i) විභාගයේ වර්ෂය :- .....
(ii) විභාග අංකය :- .....
(iii) විභාග ප්‍රතිඵල :- .....

විෂයය	ශ්‍රේණිය

අ.පො.ස. (උ.පෙළ)
(i) විභාගයේ වර්ෂය :- .....
(ii) විභාග අංකය :- .....
(iii) විභාග ප්‍රතිඵල :-

විෂයය	ශ්‍රේණිය

13. වෙනත් සුදුසුකම් : .....

14. කිසියම් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියේ වරදකරු වී ඇත්නම් ඒ හා සම්බන්ධ සියලුම විස්තර :- .....

15. අයදුම්කරුගේ සහතිකය :
මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බවත්, මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව කුමන හෝ අවස්ථාවකදී අනාවරණය වුවහොත් මෙම තනතුරට පත් කරනු ලැබීමට හෝ මෙම තනතුර දැරීමට නුසුදුසු වන බව මා දනිමි.
දිනය : .....
.....
අයදුම්කරුගේ අත්සන

16. අත්සන සහතික කිරීම :
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන..... මයා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු මා ඉදිරිපිට දී .... දින ඔහුගේ අත්සන තැබූ බවත්, මොහු අවසන් වරට මාගේ කඳවුරේ/රෙජිමේන්තුවේ .... වශයෙන් සේවය කර ..... දින නීතයනුකූලව ඉවත්ව ඇති බවත් මෙයින් සහතික කරමි.

.....
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන
(රෙජිමේන්තු ප්‍රධාන / කඳවුරු භාර නිලධාරී)

නම :- .....
තනතුර :- .....
ලිපිනය :- .....
දිනය :- .....

(නිල මුද්‍රාවෙන් සහතික කරන්න)